# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/31 – 2019 අගොස්තු 06 වැනි අඟහරුවාදා – 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 149 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2017/එච්ඩබ්ලිව්/65.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: EHE/DS/LND/05/ACQ/RDA/NED/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජුලි මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

01. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි:** ප්‍රාදේශීය ලේකම්, ඇහැළියගොඩ.

02. **ඉඩමේ විස්තරය:** සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කුරුවිටි කෝරළේ මැද පත්තුව සුළු කොට්ඨාශයේ, නැදුරණ (අ.ග.පි.53) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක ආර්/ඊඑච්එල්/2017/739 දරන 2018.09.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 'ඒ' සිට 'සී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0123 ( කැබලි 03) ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කබරයාමළදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0095**
උතුරට: නැදුරණ ඔය, එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය සහ එච්. එම්. සී. එස්. බණ්ඩාර හිමිකම් කියන කබරයාමළදෙනියවත්ත; නැගෙනහිරට: එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය, එච්. එම්. සී. එස්. බණ්ඩාර හිමිකම් කියන කබරයාමළදෙනියවත්ත, කැබලි අක්ෂර බී සහ සී; දකුණට: කැබලි අක්ෂර බී, සී සහ එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය; බටහිරට: එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය සහ නැදුරණ ඔය.

02. **කැබලි අක්ෂර 'බී' – කබරයාමළදෙනිය, කබරයාමළදෙනියවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0020**

උතුරට: කැබලි අක්ෂර ඒ, එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය සහ එච්. එම්. සී. එස්. බණ්ඩාර හිමිකම් කියන කබරයාමළදෙනියවත්ත; නැගෙනහිරට: එච්. එම්. සී. එස්. බණ්ඩාර හිමිකම් කියන කබරයාමළදෙනියවත්ත සහ මාර්ගය(මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: මාර්ගය(මාර්ග සංවර්ධන අධිකාරිය), එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය සහ කැබලි අක්ෂර සී; බටහිරට: එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය, කැබලි අක්ෂර සී සහ ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – කබරයාමළදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0008**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය; බටහිරට: එච්. උපුල් ජගත් හෙට්ටිආරච්චි හිමිකම් කියන කබරයාමළදෙනිය සහ කැබලි අක්ෂර ඒ.

08 - 761